සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය
## සිංහල භාෂාව හා සාහිත්‍යය

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 02 යි.**

• සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

### I කොටස

• **ඉරි ඇඳි පදයේ අර්ථයට සමාන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) එකොළොස් වැනි පැයේ සියලු ම ක්‍රීඩකයෝ ධාවනය වේගවත් කළහ.
(1) එකොළහට (3) නිශ්චිත අරමුණකින්
(2) වේගයෙන් (4) අන්තිම මොහොතේ

(2) දී ඇති අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.
''තමාට අයිති නැති කාර්යයක යෙදීම''
(1) ගොනා පිට හකුරු පටවනවා වැනි (3) බල්ලාගේ වැඩේ බූරුවා භාර ගත්තා වගේ
(2) කළුවා මාරපන් ගියා වගේ (4) සොරාගෙ අම්මගෙන් පේන ඇහුවා වගේ

• **3 - 4 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අර්ථයට සමාන පිළිතුර කුමක් ද?**

(3) පද්‍ය යනු තාලයකට කියවිය හැකි සේ ලියූ වචන සංවිධානයකි.
(1) විරිත (2) අරුත (3) රසය (4) වස්තු විෂය

(4) මහාධන සිටුපුත් කොට්ට මාවුලා ආදී තමන් සන්තක සියල්ලක් ම විකොට කෑවු ය.
(1) අසූ කෝටියක් පමණ (3) මසුරන් සියල්ල ම
(2) කොට්ට මෙට්ට (4) රිදී, වළන්

(5) ''දන්තජ අක්ෂර පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,
(1) ට, ඨ, ඩ, ඪ, ණ (2) ච, ඡ, ජ, ඣ, ඤ (3) ත, ථ, ද, ධ, න (4) ප, ඵ, බ, භ, ම

(6) අකාරාදි පිළිවෙළට සැකසූ විට නිවැරදි පද පේළිය කුමක් ද?
(1) නිල්වලා, ගිං, වලවේ, මාදු (3) වලවේ, ගිං, මාදු, නිල්වලා
(2) මාදු, වලවේ, නිල්වලා, ගිං (4) ගිං, නිල්වලා, මාදු, වලවේ

(7) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) පරිමාණය, මර්දනය, ජනගහනය, වර්තමාන (3) වර්ථමාන, ලේඛණ, ත්‍යාග ප්‍රදානය, සංවර්ධනය
(2) වීරෝධාර, පරිමානය, පරිගණක, ලේඛන (4) කනිෂ්ඨ, ප්‍රශ්ණ, ත්‍යාග ප්‍රධානය, කලාපය

(8) උපසර්ග පද යෙදීමෙන් පමණක් විරුද්ධාර්ථ පද සෑදී ඇති පද පේළිය තෝරන්න.
(1) නිශ්ශබ්ද, ප්‍රබල, උත්පත්ති, අවභාවිතය (3) පිරිසිදු, ඉමිහිරි, අර්ථ, උපනායක
(2) නිසරු, අවනම්බුව, නිශ්චල, අවංක (4) විදේශීය, වර්ධනය, සසල, බුදුහිමි

(9) ''වස්'' යන පදයට බහ්වර්ථ යෙදෙන නිවැරදි පිළිතුරු පද පේළිය වන්නේ,
(1) වර්ෂය, සඳහා, වයස (3) පුෂ්පය, පියවර, වතාවත්
(2) වස්සානය, උතුම්, වර්ගය (4) වේලාව, ජයග්‍රහණ, පමණ

(10) ''පඩි - නඩි'' යන යුගල පදය සැකසී ඇති ආකාරය අනුව සැකසුණු යුගල පදය කුමක් ද?

(1) දුවන පනින
(3) ලට්ට ලොට්ට
(2) කවා පොවා
(4) ළමයි බමයි

(11) පහත සඳහන් වාක්‍යාංශයට ගැළපෙන තනිපදය කුමක් ද?
''අනුන්ගෙන් පෝෂණය වන''

(1) දුශ්පෝෂිත (2) මන්දපෝෂිත (3) සුපෝෂිත (4) පරපෝෂිත

(12) ශබ්ද කෝෂ අනුව අකාරාදි පිළිවෙළට සැකසූ පසු,
කටුගානවා කටුගෙය යන වචන දෙක අතරට එන ඊළඟ වචනය වන්නේ කුමක් ද?

(1) කටුගැස්ම (2) කටුගසනවා (3) කටු පහණ (4) කටු පොත

(13) ආදි ශිෂ්‍යයෝ අප පිළිගත් හ. වාක්‍ය කර්මකාරකයට පෙරලූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) ආදි ශිෂ්‍යයන් විසින් අපි පිළිගන්නා ලදී.
(3) ආදි ශිෂ්‍යයෝ විසින් අපි පිළිගනු ලබති.
(2) ආදි ශිෂ්‍යයන් විසින් අපි පිළිගැනුණෙමු.
(4) ආදි ශිෂ්‍යයන් විසින් අප පිළිගන්නා ලදහ.

(14) නිත්‍ය බහු වචන පද පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?

(1) සමහරෙක්, කණ්ඩායමක්
(3) කවරෙක්, පිරිසක්
(2) අයෙක්, පිරිසක්
(4) කෙනෙක්, ඇතමෙක්

(15) ''ඔවුහු'' යන පදය,

(1) ප්‍රථම පුරුෂ අනුක්ත ඒකවචන පදයකි.
(3) මධ්‍යම පුරුෂ උක්ත බහුවචන පදයකි.
(2) ප්‍රථම පුරුෂ උක්ත බහුවචන පදයකි.
(4) මධ්‍යම පුරුෂ අනුක්ත ඒක වචන පදයකි.

(16) ''ගස'' යන පදයට සමානාර්ථවත් පදයක් ඇතුළත් වරණය වන්නේ,

(1) කසුන්
(3) පාදප
(2) පුල්
(4) අඹ

(17) නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.

(1) ''උගුර'' ඇසුරෙන් උපදින ශබ්ද 'ඕෂ්ටජ'' වේ.
(3) ''සෙමෙන්'' යන පදය නාම විශේෂණයකි.
(2) 'ර්' පසුව සැම විට ම 'ය' යෙදේ.
(4) කර්මකාරක වාක්‍යයක කර්ම පදය උක්ත වේ.

(18) විරුද්ධාර්ථ පද යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) කල්පිත - මනඃකල්පිත
(2) පරිණාමය - පරිමාණය
(3) ප්‍රවීණ - ආධුනික
(4) නවීන - නූතන

**19 - 20 ප්‍රශ්නවල සඳහන්වන පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.**

(19) ''පරක් තෙරක් නැති මහ සයුර ජය ගැනීම අද මානව සංහතිය හමුවේ ඇති ඉමහත් අභියෝගයකැ''යි කිව හැකිය.

(1) පරක් තෙරක් නැති මහ මුහුද ජය ගැනීමට මිනිසාට හැකිය.
(2) නොපෙනෙන මහ සයුර ජය ගැනීම අද මිනිස් වර්ගයා හමුවේ ඇති ඉමහත් තර්ජනයකි.
(3) මහ සයුර මිනිසාට තර්ජනයක් මෙන් ම අභියෝගයකි.
(4) තර්ජනයක් විය හැකි මහ මුහුද මිනිසා අභියෝගයකි.

(20) බෞද්ධ පුනර්ජීවයේ පුරෝගාමියෙකු වූ ඕල්කට් තුමා කොළඹ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීය.

(1) බෞද්ධ විඥානාර්ථ සමාගම පිහිටුවීමෙන් පසු ඕල්කට් තුමා පුරෝගාමියෙක් විය.
(2) පුරෝගාමී ඕල්කට්තුමා බෞද්ධ පුනර්ජීවනයේ පරම විඥානාර්ථ සමාගම පිහිටුවූවේය.
(3) කොළඹ පරම විඥානාර්ථ සමාගම පුරෝගාමී වී ඕල්කට් තුමා පිහිටෙව්වේය.
(4) බුද්ධාගම නව පණ ගැන්වීමේ නායකයෙකු වූ ඕල්කට් තුමා කොළඹ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීය.

(ලකුණු 2 5 20 = 40)

## II කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) ''ජලය'' නම් තේමාව යටතේ, බිත්ති පුවත්පතක් සැකසීමට ඔබ කණ්ඩායමට පැවරුණේ යැයි සිතන්න. ඒ අනුව පහත සඳහන් ප්‍රශ්නවල පිළිතුරු සපයන්න.

(i) බිත්ති පුවත්පත සඳහා ඔබ යෙදූ නම කුමක් ද? (ලකුණු 01)

(ii) මෙහිදී ඔබ වෙත පැවරුණු වගකීමක් ලියන්න. (ලකුණු 02)

(iii) ගුරුභවතාගෙන් ඔබට ලැබුණු උපදෙසක් ලියන්න. (ලකුණු 01)

(iv) බිත්ති පුවත් පත සැකසීමේ දී ඔබට ඇති වූ ගැටලුවක් ලියන්න. (ලකුණු 01)

(v) ඔබ එම ගැටලුව විසඳා ගත් ආකාරය සඳහන් කරන්න. (ලකුණු 01)

(2) පහත සඳහන් මාතෘකාවලින් **එකක්** තෝරා ගෙන වචන 200කට නො අඩු රචනයක් ලියන්න.

(i) ලෝකෙන් උතුම් රට ලංකාවයි

(ii) ගොඩ මඩ වවමු - රට නගමු.

(iii) කියවීම අතපසු කරන ළමයි හෙට දිනන්නේ කෙසේ ද?

(iv) මම දහම් පාසල් යන දරුවෙක්මි.

(v) අභියෝග ජයගත හැක්කේ කෙසේ ද? (ලකුණු 20)

(3) පෙළ පොත ඇසුරෙන් අසා ඇති පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''ඉදින් මේ සිටු පුත්‍රයාණෝත් රා සොඬහු නම් අපට මහා සැප ය.''

(අ) ඉහත සිතුවිල්ල කාගේ ද?

(ආ) මෙම උද්ධෘතය උපුටා ගත් කෘතිය නම් කරන්න.

(ඉ) එහි කතුවරයා කවුරුන් ද?

(ii) ''මම මාගේ වැඩිමහල් සහෝදරයන් දෙදෙනා මගට බැස්සීමට සතුටු නොවෙමි.''

(අ) ඉහත ප්‍රකාශයේ 'මම' යනුවෙන් සඳහන් ව ඇත්තේ කවුරුන් පිළිබඳව ද?

(ආ) මෙම උද්ධෘතය උපුටා ගත් පාඩම කුමක් ද?

(ඉ) මෙම ප්‍රකාශයෙන් කියැවෙන්නේ කුමක් පිළිබඳව ද?

(iii) (අ) ''ඇසේ මතුවන කඳුළු බිඳුගෙන...'' ගීතය රචනා කළේ කවුරුන් ද?

(ආ) එම ගීතයෙන් කියැවෙන්නේ කුමක් පිළිබඳව ද?

(ඉ) එම ගීතයේ ඉතිරි පද තුන ලියන්න.

(iv) (අ) 'නවම් මහේ නව වළල්ල' පාඩම සඳහා ඇසුරු කරගත් කෘතිය කුමක් ද?

(ආ) එහි කතුවරයා නම් කරන්න.

(ඉ) ධීවරයාගේ සුබ කාලය හඳුන්වන්නේ කෙසේ ද?

(v) (අ) 'පියසමර' කෘතිය කාගේ නිර්මාණයක් ද?

(ආ) එම කෘතියෙන් කියැවෙන්නේ කුමක් පිළිබඳව ද?

(ඉ) ඉහත කතුවරයා විසින් ලියැවුණු ව්‍යාකරණ ග්‍රන්ථයක් නම් කරන්න. (ලකුණු 3 5 5 = 15යි)

(4) **පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

ශ්‍රී ලංකාවේ ප්‍රබන්ධ සාහිත්‍යය වර්ධනයෙහි ලා සම්භාව්‍ය සිංහල සාහිත්‍යය ග්‍රන්ථ මුල් වූ බව එක් කරුණකි. අමාවතුර, බුත්සරණ, පූජාවලිය, සද්ධර්මාලංකාරය, සද්ධර්ම රත්නාවලිය, ජාතක පොත ආදිය පසුකාලීනව ගද්‍යකරණයට දායක වී ඇත. එකී ගද්‍ය සම්ප්‍රදාය හා බැඳී ආ ජනකතා සාහිත්‍යයෙන් ද ප්‍රබන්ධ සාහිත්‍යයට පෝෂණය ලැබිණි. කෝට්ටේ යුගයෙන් පසු බිඳ වැටී තිබුණු භාෂා සාහිත්‍යය මෙන්ම අධ්‍යාපනය නඟා සිටුවීමෙහි ලා දායක වූයේ වැලිවිට සරණංකර හිමියන් ය. උන්වහන්සේගේ ශිෂ්‍ය පරම්පරාව රැක ගැනීමටත් ශාස්ත්‍රෝන්නතිය සඳහා මහත් ව්‍යාපාරයක් ගෙන ගියහ. මුද්‍රණ යන්ත්‍ර ආරම්භයත් සමඟ පැරණි සම්භාව්‍ය කෘති යළි මුද්‍රණය වන්නට පටන් ගැනීමත් භික්ෂු පරපුරට හිමිව තිබූ අධ්‍යාපන අයිතිය හා ලේඛන හැකියාව ගිහි පාර්ශවය වෙතට පැතිර යාමත් සාහිත්‍යය උන්නතිය කෙරෙහි බලපෑවේ ය.

(i) සාහිත්‍ය උන්නතියට බලපෑ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සම්භාව්‍ය සිංහල ග්‍රන්ථ දෙකක නම් ලියන්න. (ලකුණු 02)

(iii) කෝට්ටේ යුගයෙන් පසු බිඳ වැටී තිබුණු සාහිත්‍යය නඟා සිටුවූයේ කවු ද? (ලකුණු 01)

(iv) ප්‍රබන්ධ සාහිත්‍ය වර්ධනයට මුල් වූයේ කුමක් ද? (ලකුණු 01)

(v) රකාරාංශය යෙදුණු පදයක් උපුටා ලියන්න. (ලකුණු 01)

(5) ඔබ විද්‍යාලයේ 9 ශ්‍රේණියේ සිසුන් සංවිධානය කළ වාර්ෂික කලා උළෙල සඳහා පහත සඳහන් කරුණු ද ඇසුරු කර ගනිමින් සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

දිනය : 2019.07.31

ස්ථානය : විද්‍යාලයීය ප්‍රධාන ශාලාව

වේලාව : පෙ.ව. 8.30ට

ප්‍රධාන ආරාධිත අමුත්තා : කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා

ආරාධිත දේශනය : සාහිත්‍ය සූරී චන්දන ඔබේසේකර මහතා (ලකුණු 10)